# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2074/6 - 2018 ජුනි මස 04 වැනි සඳුදා - 2018.06.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 13/99/VE/115.
*මගේ අංකය* : උප/3/ඉඅත්/139 (පැරණි අංකය).
KDS/DOL/4/4/51/10 (NEW).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඳුකර පහළ කෝරළේ පිටවල ග්‍රාම නිලධාරි වසමේ පිටවලගම ගමේ පිහිටි මැණුම්පති විසින් මැන පිළියෙල කරන ලද මහ 5108 දරන පිඹුරේ කැබලි අංක 01 සිට 04 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.0824ක් පමණ වන පහත සඳහන් මායිම් තුල පිහිටි ලෙවලන් වත්ත නම් ඉඩම් කොටස් (04).

01. **මූලික පිඹුරු අංකය: 5108හි කැබලි අංක 01**
ඉඩමේ නම: ලෙවලන් වත්ත; මුල් හිමිකම් කියන්නා: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, කොළඹ 02; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.7223.

02. **මූලික පිඹුරු අංකය: 5108හි කැබලි අංක 02**
ඉඩමේ නම: ලෙවලන් වත්ත; මුල් හිමිකම් කියන්නා: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, කොළඹ 02; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.8354.

03. **මූලික පිඹුරු අංකය: 5108හි කැබලි අංක 03**
ඉඩමේ නම: ලෙවලන් වත්ත; මුල් හිමිකම් කියන්නා: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, කොළඹ 02; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 2.7687.

04. **මූලික පිඹුරු අංකය: 5108හි කැබලි අංක 04**
ඉඩමේ නම: ලෙවලන් වත්ත; මුල් හිමිකම් කියන්නා: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, කොළඹ 02; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.7560.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ජූලි මස 11 වැනි දින පෙ.ව. 10.00ට දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2018 ජූලි මස 04 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී. ඒ. ඩී. ඩබ්. දයානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

2018 මැයි මස 31 වැනි දින,
දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

(අංක 1151/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ III වැනි කොටස - ඉඩම් - යටතේ රජයට ඉඩම් අත්කර ගැනීමේ මාගේ යොමු අංක/උප/3/ඉඅත්/139 හි මා විසින් නිකුත් කරන ලද දැන්වීම මෙයින් අවලංගු කරන බව දන්වමි).

06 - 758


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A – G 27803 - 27 (2018/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.